සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල I
சிங்களம் I
Sinhala I

**71 S I**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොද ගන්න.

- පහත දක්වෙන උද්ධෘත පාඨ කියවා, ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**1.** (අ) මේ මහණ මටත් වඩා කැවුමට රුචි ඇති වන. නොළදහොත් මෙතුරම් තරයක් ඇති නැතැත්තෝ නොයෙති. එක් කබලු කැවුමක් දෙවම්'යි පිස නිමියායෙන් දෙනහොත් එක් කබලු කැවුම් මහතැ'යි සිතා සිටුදුවණියන්ට කුඩාම කොටලා කබලු කැවුමක් පිසලා තුලුන්ට දී උන් මෙතැනින් නික්මෙන ලෙසක් කරව'යි කිවු ය. සිටුදුවණියෝ ද හැඳි අගින් පිටි සුහිත්තක් හැරගෙන කබලු පිසන කබලේ වත්කොට ලූ ය. සුධා භෝජන ජාතකයෙහි මෙම මසුරු සිටාණන් කිරිබත් කන්ට පත් ගෙනෙන්ට කී කල හිමවතට අත පොවාලා අඩණ සා මහත ඇති මාලුවාපත් අතුළා සේම පිටි සුහක් වත්කළත් මහ තෙරුන් වහන්සේගේ ආනුභාවයෙන් ආදි පිසු කබලු මුළුල්ලටත් වඩා කුඩා කරන්නට සිතූ කබලු කැවුම මහත් විය.

(i) පිටි සුහක් වත්කොට පිසූ කැවුම ඊට පෙර පිසූ කැවුම් සියල්ලට ම වඩා විශාල වූයේ කවර කරුණක් නිසා ද?
(ii) "හැඳි අගින් පිටි සුහිත්තක් හැරගෙන" මෙහි සුහිත්තක් යන්න ව්‍යාකරණමය වශයෙන් කවර පද වර්ගයට අයත් ද?
(iii) ප්‍රමාණයෙන් කුඩා කැවුමක් පිස නැතිමට සිටුදුවණිය අනුගමනය කළ උපක්‍රමය කුමක් ද?
(iv) තරයක් "පිස නිමියායෙන්" යන වචනවලට අර්ථ සපයන්න. (ලකුණු 04 යි)

(ආ) ඉක්බිති බෝධිසත්ව තෙම ළඟට ගෙන්වා සොඬින් අල්වා ගෙන සබඳ වැදි පුත්‍රය, මේ දළ තොපට දෙන්නෙම් මට අප්‍රියයි සිතා දෙන්නමුත් නොවෙමි. ශක්‍ර සම්පත් බ්‍රහ්ම සම්පත් පතා දෙන්නමුත් නොවෙමි. මේ දළටත් වඩා දහස් ලක්ෂයක් ගුණයෙන් සර්වඥතාඥනය නමැති දන්තයෝම ප්‍රියයෝ ය. එබැවින් මේ දනය බුදුබවට කාරණා වේවයි දළ දෙකත් දී 'සබඳ තෙපි කෙතෙක් දවසකින් මෙතනට අවුද'යි විචාරා සත් අවුරුදු සත් මස් සත් දවසකින් ආමි කී කල්හි එසේ වී නම් මේ දළෙහි ආනුභාවයෙන් සත් දවසකින් බරණැස් නුවරට පැමිණේවයි කියා සත්‍යක්‍රියා කොට යැවූයේ ය. ඔහු ගිය ඉක්බිති අටදිග ගිය ඇතුන් ද අහසට නැගී ඇතින්නිය ද එන්ට පළමුව බෝධිසත්වයෝ කාලක්‍රියා කළාහ.

(i) බෝධි සත්ත්වයන් දළ දෙක දන් දී ප්‍රාර්ථනා කළේ කුමක් ද?
(ii) වැදි පුත්‍රයාට සත් දවසකින් බරණැස් නුවරට යාමට හැකි වූයේ කවර හේතුවක් නිසා ද?
(iii) බෝධි සත්ත්වයන් සොයා ගැනීම සඳහා වැදි පුත්‍රයාට කොපමණ කලක් ගතවී ද?
(iv) **'අටදිග' 'කාලක්‍රියා.'** යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 04 යි)

(ඉ) රාජ කුමාරයෝ ද යහපතැයි ගිවිස අශෝකමාලා දේවීන් ළඟට කැඳවා 'සොඳුර', රජ්ජුරුවන් වහන්සේ අද මේ මාළිගාවට වඩනා සේක්ල; ඒ ගමන තොප දක්නා පිණිස එන ගමනෙකැ'යි සිතමි. එසේ හෙයින් තොප විසින් කළමනා කටයුත්තෙහි අප්‍රමාද වේව'යි කීහ. එබස් අසා අශෝකමාලා දේවී රජ්ජුරුවන් හා අමාත්‍යවරුන් ඇතුළු ව සියලු සේනාවට බත් මාලු කැවුම් පෙවුම් ආදී නොයෙක් කන බොන දෑ සපයා තිබූහ. ඉක්බිති රජ්ජුරුවෝ බළ සෙනඟ පිරිවරා මහත් වූ රාජානුභාවයෙන් යුක්තව යුවරජ්ජුරුවන්ගේ මාළිගාවට අවුත් වන්හ. එකල්හි යුවරජ්ජුරුවන් හා ඇඹේණියෝ රජ්ජුරුවන්ට පෙර ගමන් කොට වැඳ එකත්පස්ව සිටියහ. එවේලෙහි රජ්ජුරුවෝ දෙව්ලොවින් බට දෙවඟනක සේ රූපශ්‍රීන් දිලිහි දිලිහී සිටි අශෝකමාලා දේවීන් දැක මහත් වූ සන්තෝෂයට පැමිණ 'පින්වත් අශෝකමාලා දේවී නම් තෙපිද'යි විචාළහ.

(i) රජ්ජුරුවන් වහන්සේ මාළිගාවට වැඩියේ කවුරුන් දක්නා පිණිස ද?
(ii) යුවරජු හා ඇඹේණිය විසින් රජතුමා ඇතුළු පිරිස පිළිගන්නා ලද්දේ කෙසේ ද?
(iii) අශෝකමාලා දේවී රජතුමාට හා ඇමති පිරිසට සංග්‍රහය පුදනම් කෙළේ කවරාකාරයකින් ද?
(iv) **'ඇඹේණියෝ', 'එකත්පස්ව'** යන වචනවල තේරුම් ලියන්න. (ලකුණු 04 යි)

[දෙවැනි පිටුව බලන්න.

www.pastpaperlk.com

(ඊ) ගැඹුරු විජම් පෙළ කිරි සයුර ඇම ‍පිට
සොඳුරු නුවණ මෙර පහරින් සකොබ ‍ගාට
මිහුරු පද අරුත් අම් ගේන දෙන් ලොවට
කවුරු සදිසි වෙති මෙකලට එ යතිඳුට

විහිගුම් නොයෙක් දිටු සකිලිටු ගිම් විහිට
දෙනතුම් සගපවග පල සිරි මුළු ලොවට
නරදම් සැරි සුතුරු දම් තුඟු සුර තුරට
මනරම් ඔහු නුවණ දෙරණ ම විය පිහිට

(i) මෙකියන යතිඳු අභිධම් පිටකයෙහි මිහිරි වූ පදර්ථ ලෝකයාට ගෙන දෙන්නේ කවරාකාරයෙන් ද?

(ii) බුදුරජාණන් වහන්සේගේ සූත්‍ර ධර්මයෙන් දුරු කෙරෙන්නේ කුමක් ද?

(iii) **"විජම් පෙළ කිරි සයුර"** යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.

(iv) **'සුතුරුදම් තුඟු සුරතුරට'** යන්නෙන් අදහස් කළේ කුමක් ද? ((ලකුණු 04 යි)

(උ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) 'රජ්ජුරුවන් වහන්ස, මට උපන්නේ ඉතා ලැබිය නොහැකි දෙළෙක.'

(ii) 'මා විසින් විචාරන ලද ස්ත්‍රිය නාගේ නාම ගෝත්‍රය ද බන්ධු ද නොවලහා ඇති සැටිම කියව'

(iii) 'මමත් පෙර ජාතියේ කරන ලද කුසල් ඇත්නම්මය'

(iv) 'වැඩිය පමා වෙන්නෙ නැතිව යන්න. මා [illegible] බලන්න ඕනනම් ආයෙමත් හෙට එන්න බැරිය'

(v) 'ලැජ්ජා වෙන්න එපා, මම කා එක්කවත් කියන්නෙ නැහැ'

(vi) 'මෙන්න මේ පැනෙල් කමිසෙ ඇඳගෙන ඇඳට වෙලා ඉන්ඩ' ((ලකුණු 08 යි)

(ඌ) පහත දක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

බියපත් වූ ආකාසය මේකුළු පිටුපස සැඟවෙ යි
නයි පොළොංගු වාගේ ගන'දුර අප සිරුරේ එල්ලෙ යි
දෙදරවමින් මිහි මඩලම ගොරතර හෙණහඬ පැතිරෙ යි
ලේ තැවරුණු කඟපත ඇති විදුලිය පැන පැන දුව ය යි

තැතිගත් ඇයගේ දෑසින් බිය හෙම්හිට ගලා බසි යි
දැඩි ලෙස කැලඹී ඇති ඇගෙ සිහිති මුහුණ මැලවී ය යි
යුහුව මවෙත දුව අවුදින් මා ඇකයේ හිස සඟව යි
අවට ලොවින් බේරාගන්නා ලෙස ගොළු බසින් යදි යි

බිය නොවන්න දියණිය, ඔබ සිටිනු මැනවි නොවී සස ල
කෙඳියක නතු කළ සක්විති රජ කොනෙක්ම් යුතු නෙද බ ල
දුටු සඳ මා ගනකුළු විදුලිය හා හෙණ හඬ ද [illegible] ල
බැගෑපත්ව වැතිරෙනු ඇත දුවැ'විත් මා දෙපා [illegible] ල

නාගල කන්දෙන් හෙණ හඬ නැඟී අහස දෙදුර. වි ට
දිව ගොස් මම එකල වැලඳ ගතිම් නාත්තා හද [illegible] ට
ඔහුගේ ඇකයේ උණුසුම දැනුදු දැනෙනවා මා හ ට
මේ සති අන්තයෙ කෙලෙසින් හෝ මා යා යුතුය ගම ට (ලකුණු 16 යි)

2. 'අවස්ථා නිරූපණයේ දී සද්ධර්මරත්නාවලී කතුවරයා පළ කරන කුසලතාව සුදුසු අවස්ථා **තුනක්** ආශ්‍රයෙන් සනිදර්ශන ව විභාග කරන්න. (ලකුණු 15 යි)

**නැතහොත්**

"පූර්ව නිශ්චිත ආකෘතියක් ඇතුළත වුව ද සාර්වකාලීන වටිනාකමක් සහිත ව කතාවක් ඉදිරිපත් කිරීමට ජාතක කතාකරුවා සමත් වී තිබේ." නියමිත කතා **දෙකක්** ඇසුරෙන් උක්ත කියමන විමසන්න. (ලකුණු 15 යි)



www.pastpaperlk.com

3. "කුසලාකුසල කර්ම හා ඒවායේ විපාක කෙරෙහි මූලිකාවධානයක් යොමු කරමින් ජීවිත විවරණයක යෙදීම සද්ධර්මාලංකාර කතුවරයාගේ අභිප්‍රාය විය." නියමිත කතා ඇසුරු කොට ගෙන මෙම අදහස විභාග කරන්න. (ලකුණු 15 යි)

4. "ගිරා සන්දේශය රමණීය දූත කාව්‍යයක් බවට පත්ව තිබෙන්නේ ශබ්දාර්ථ සුසංයෝගයෙන් අනූන පද්‍ය ඇතුළත්වීම හේතුවෙනි." වර්ණනා **දෙකක් වත්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

5. විදේශීය අසුබිමක් තේමා කොට ගැනුණු චරිත හා සිද්ධිදාමයක් දේශීයත්වයට ගැළපෙන ආකාරයෙන් කලාත්මක ව ප්‍රතිනිර්මාණය කිරීමට කතුවරයා දක්වන කුසලතාව "මළගිය ඇත්තෝ" ආශ්‍රයෙන් නිදර්ශන සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

6. "පුහුමාන්නයත් තනතුරු ලෝභයත් සියුම් ව උපහාසයට ලක් කෙරෙන කෙටිකතාවක් වශයෙන් 'මුදියන්සේ මාමා' අගය කළ හැකි ය." මෙහි සත්‍යාසත්‍යතාව නිදසුන් සහිත ව විමසන්න. (ලකුණු 15 යි)

7. "සමාජ අසාධාරණය තේමා කොට ගෙන පද්‍ය නිර්මාණය කිරීමට නූතන කවිහු අභිරුචියක් දක්වති." නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට ගනිමින් පහදන්න. (ලකුණු 15 යි)

8. හාස්‍ය රස ජනනයෙහි ලා "රත්නාවලී නාට්‍ය" කතුවරයා දක්වන සාමර්ථ්‍යය එහි චරිත නිරූපණය කෙරෙහි විශේෂාවධානයකින් යුක්ත ව විමසීමට ලක් කරන්න. (ලකුණු 15 යි)

* * *

www.pastpaperlk.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

විභාග අංකය : ..............................

උපදෙස්:
* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

1. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.** (ලකුණු 20 යි)

1.1. **ඝෝෂ** මහාප්‍රාණාක්ෂර සේ සැලකෙන්නේ කවරක් ද?
   (1) ක, ච, ට, ත, ප
   (2) ඞ, ඤ, ණ, න, ම
   (3) ඝ, ඣ, ඪ, ධ, භ
   (4) ඛ, ඡ, ඨ, ථ, ඵ
   (5) ය, ර, ල, ව,
   (.........)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
   (1) රතුළුණු, මාංශ, අණ්ඩ, ඍතය
   (2) දියලුණු, ප්‍රදනය, ප්‍රශස්ත, ගනඳුර
   (3) ප්‍රශ්ණ, ආචාර්ය, නිධාන, ඍණය
   (4) ප්‍රධාන, අත්‍යවශ්‍ය, බ්‍රාහ්මණ, නුගුන
   (5) ආශ්වාද, කපීකාවත, ලමයා, දර්ශණ
   (.........)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
   (1) කාව්‍යශේඛරය, ගුත්තිලය, සසදවත, රුවන්මල
   (2) බුත්සරණ, අමාවතුර, ධර්මප්‍රදීපිකාව, පියුම්මල
   (3) සහරජවත, මොරකොටවත, දහම්සරණ, තුන්සරණ
   (4) අමාවතුර, කව්සිළුමිණ, බුත්සරණ, රාජාවලිය
   (5) ජානකීහරණය, මේඝදූත, ඡන්දෝමඤ්ජරී, වෘත්ත රත්නාකර
   (.........)

1.4. පහත සඳහන් වරණ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
   (1) කොම්බු දෙක සිංහලයේ 'ඖ' කාරය වෙනුවට ව්‍යඤ්ජනයකට මුලින් පමණක් යෙදෙයි.
   (2) කොම්බු දෙක සිංහලයේ ස්වරයක මුලට පමණක් යෙදෙයි.
   (3) කොම්බු දෙක සඳහා ගයනුකිත්තද යෙදිය හැකි ය.
   (4) කොම්බු දෙක සිංහලයේ 'ඓ' කාරය නියෝජනය වීම සඳහා ව්‍යඤ්ජනයකට මුලින් පමණක් යෙදෙයි.
   (5) කොම්බු දෙක යෙදිය හැක්කේ 'ඓ' කාරයට මුලින් පමණි.
   (.........)

1.5. **යංශය, රකාරාංශය, රේඵය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
   (1) ප්‍රථම, සෞඛ්‍ය, වෛද්‍ය, කතෘ
   (2) ප්‍රවර, ලෞකික, කාව්‍යාදර්ශය, අමනුෂ්‍ය
   (3) ග්‍රහයා, ප්‍රත්‍යය, ඖෂධ, ධර්මය
   (4) චක්‍රය, අද්‍යතන, මූලාශ්‍රය, භෞමික
   (5) විභක්ත්‍යර්ථ, සම්ප්‍රදය, වර්ගීය, පෞරාණික
   (.........)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
   (1) සම්භාව්‍ය සාහිත්‍ය, සොබා ධර්මය, විභක්ති ප්‍රත්‍යය, කම් විභාග
   (2) අමාත්‍ය මණ්ඩලය, උවදුරු මර්දනය, සාහිත්‍ය උත්සවය, මාතෘ බාසා
   (3) රාජ්‍ය අනුග්‍රහය, වංශ කතා, පූර්ව ස්වර, මිශ්‍ර කිරිය
   (4) පුරාවිද්‍යා, දිව්‍ය ලෝකය, මධ්‍ය විද්‍යාලය, සම්ප්‍රදාන විභක්තිය
   (5) ධර්ම ද්වීප, සාහිත්‍ය පොත්, ප්‍රවෘත්ති ඇමති, ග්‍රන්ථ සැකැස්ම
   (.........)

1.7. **තත්සම වචන පමණක්** අන්තර්ගත වරණය කුමක් ද?
   (1) ශීත, චතුර, ගෝචර, තරුණ
   (2) ලවණ, හිස, දක්ෂ, වෛද්‍ය
   (3) මෘදු, මිශ්‍ර, පුණ්‍ය, රළු
   (4) කාන්තා, ධවල, තීක්ෂ්ණ, කිලිටි
   (5) ධර්ම, හස්ත, ගහ, යාත්‍රා
   (.........)

1.8. මුලින් දක්වෙන පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) වර්ධන - හායන, මර්දන, පරිහානි, ක්ෂය
   (2) ආධුනික - නිපුණ, ප්‍රවීණ, ඡේක, දක්ෂ
   (3) පුරාණ - නව්‍ය, නවීන, නූතන, අලුත්
   (4) මහත් - කුඩා, පොඩි, සුළු, පුංචි
   (5) අකුටිල - ඇද, වක්‍ර, කුටිල, අවංක
   (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) කෝමල - මුදු, මෘදු, සිනිඳු, සොම්
(2) පෙරදිග, - පැදුන්, ප්‍රාචීන, නැගෙනහිර, උදගිර
(3) මිතුරු - සුහද, මිත්, සකි, මිත්‍ර
(4) නිමල - විමල, නිර්මල, පිරිසිදු, මලින
(5) පිපුණු - විකසිත, පුල්, පුබුදු, ප්‍රබෝධ
(.........)

1.10. **විභක්ති, විශේෂණ, ද්වන්ද්ව, අව්‍යය** යන සමාසවලට අයත් පද **පිළිවෙළින්** දක්වා ඇති පේළිය තෝරන්න.
(1) අකුසල්, අත්කම්, ඇළදොළ, නිලුපුල්
(2) අනුබල, නිල්මල්, කිරිබත්, ගීනැටුම්
(3) ගත්කරු, සුදුරෙදි, වතුපිටි, නොමිනිස්
(4) මාපිය, නවරස, බුදුගුණ, උපනගර
(5) අසුර, බරනෙත, ඇත්දළ, රත්මල්
(.........)

1.11. **කෘදන්ත පදයක් අන්තර්ගත නො වන** වරණය තෝරන්න.
(1) ලියමන්, කියමන්, වියමන්, පිසමන්
(2) මැරූ, කියූ, දිවූ, නැඟූ
(3) යනු, එනු, බලනු, දුවනු
(4) කැවිලි, පෙවිලි, දපිලි, දැමිලි
(5) වදළ, විචාළ, අගල, හදළ
(.........)

1.12. පහත සඳහන් වැකිවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
* දරුවා **හඬමින්** ගෙදර යයි.
* වැසි **වසිතොත්** වැව් පිරෙයි.
* අම්මා දරුවන් **දැක** හැඬුවා ය.
* ගොවියෝ දරුවන් ලවා ගොයම් **කපවති.**

(1) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(2) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා
(4) ප්‍රයෝජ්‍යක්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, අසම්භාව්‍යක්‍රියා
(5) අසම්භාව්‍යක්‍රියා, පූර්වක්‍රියා, ප්‍රයෝජ්‍යක්‍රියා, මිශ්‍රක්‍රියා
(.........)

1.13. **අනුක්ත පද දෙකක් හා උක්ත පද දෙකක්** ඇති පේළිය තෝරන්න.
(1) හිමියන්, කුකුළන්, අප, දරුවෝ
(2) මා, දෙවියකු, එළුවකු, ළමයි
(3) හරකකු, සමනල්ලු, මොනරුන්, ළමයකු
(4) මිනිස්සු, යකකු, ගැහැනියක, දෙවියෝ
(5) වැසියෝ, ගම්මු, හස්තීහු, මාළුවකු
(.........)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.
(1) ප්‍රබල, නිකෙලෙස්, වියෝග, අබිමන්
(2) පිරිසුදු, උපහාර, අනුරූප, අවමන්
(3) ප්‍රතිඵල, අවගුණ, ප්‍රත්‍යක්ෂ, අභිධර්ම
(4) සුගන්ධ, සුමති, සුවිසි, සම්මුති
(5) අතිධාවන, උද්ඝෝෂණ, උපසර්ග, ප්‍රයෝග
(.........)

1.15. "**සුරන් සහ සඟසැස් නො** කර සිටියේ අභස්කුස් හිස්" යන්නෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) නිපාත, සමාස හා විභක්ති
(2) සමාස, නිපාත හා විභක්ති
(3) විභක්ති, නිපාත හා සමාස
(4) නිපාත, විභක්ති හා සමාස
(5) විභක්ති, සමාස හා නිපාත
(.........)

1.16. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) නටා, බලා, අතුරා, පතුරා
(2) යත, එත, කියත, බලත
(3) මව්පිය, තිසරණ, ලඹසවන්, ගම්බිම්
(4) යමින්, එමින්, කමින්, දුවමින්
(5) උදෙසා, පිණිස, සුදු, හෝ
(.........)

1.17. **සමාස පදයක් ඇතුළත් නො වන** වරණය තෝරන්න.
(1) අනදර, අනිටු, අනුබල, සුසිරිත්
(2) සිසිල්පැන්, තුන්දෙර, ඇස්ඉස්මස්, ගීනැටුම්
(3) ගල්හිත, පසැස්, කුශලතා, අසුර
(4) කහබත්, අසරණ, දුර්ජන, හාමස්
(5) නිල්මල, පාතඹර, තුන්ලෝ, සුරිඳු
(.........)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.
(1) සන්නස්, දඬුවම්, ලිග්ගල, පත්තිරු
(2) අත්‍යවශ්‍ය, ජාත්‍යාලය, පෘථග්ජන, වියවුල්
(3) යතීන්ද්‍ර, මුනීන්ද්‍ර, ස්වාමීන්ද්‍ර, කවීන්ද්‍ර
(4) බුද්ධීන්ද්‍රිය, ගුරූපදේශ, වස්තූපමා, නරේන්ද්‍ර
(5) විරෝද්දර, වක්‍රෝක්ති, අංගෝපාංග, දේශාභියෝගය
(.........)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වාක්‍යය** තෝරන්න.
(1) සමහරු විනෝදයට නොයෙක් නැටුම් නටති.
(2) සිරිසඟබෝ රජතුමා දැහැමි පාලකයකු විය.
(3) අපි මෙසේ කියතියි කවුරු විශ්වාස කරත් ද?
(4) අප විසින් සමගිදම් රැකිය යුත්තෙමු.
(5) විනිසුරුතුමා පැමිණිලිකරුගෙන් මෙසේ ප්‍රශ්න කළහ.
(.........)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.
(1) ස්වර පිළිබඳ ව සිදතේදක්නටනොලැබෙන තවත් ප්‍රභේදයක් සංස්කෘතවියරණ ඇදුරෝ දක්වති.
(2) අධිකවර්ෂාව පැවතුණුහෙයින් කුඹුරුසියල්ල ම වතුරට යටවුණි.
(3) සිංහලජනවහර විද්‍යාත්මකවශයෙන් හැදෑරිය යුතු කාලය දැන් එළඹ තිබේ.
(4) ජාතකපොතෙහි ඇතැම්වර්තමාන වස්තුකෙටිකතාවට ළංවෙන තරමනව්‍යස්වරූපයක් ගනියි.
(5) වාක්‍යයක නාමපදයක්වෙනුවට යෙදෙන නාමය සර්වනාම යනුවෙන් හැඳින්වේ.
(.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2013 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2013

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

87941

## II කොටස

2. (අ) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පැරණි ග්‍රන්ථයක් වටහා ගැනීමට නම්, එහි දක්වෙන භාෂාවෙහි ව්‍යාකරණ හා අලංකාර පිළිබඳ මනා අවබෝධයක් විමර්ශකයා සතුව පැවැතිය යුතු ය. භාෂාවක අර්ථය සෙවීමේ මුඛ්‍ය මාර්ගය එම භාෂාවෙහි ව්‍යාකරණයයි. 'අලංකාර' යනුවෙන් මෙහි අදහස් කරනුයේ භාෂාවෙහි සමස්ත ප්‍රයෝගයයි. පාඨයක ව්‍යාකරණය ඉක්මවා යන අර්ථ සෙවිය හැක්කේ අලංකාර විභාගය තුළිනි. ඉදින් වෘත්තයෙන් බඳනා ලද කෘතියක් නම්, එහි අවබෝධය සඳහා ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ දැනුම අනිවාර්ය වෙයි. ගද්‍ය ග්‍රන්ථයක් වුව ද හරි හැටි වටහා ගැනීමෙහි ලා මෙම දැනුම අත්‍යවශ්‍ය වේ. ග්‍රන්ථයක් වටහා ගැනීමේ දී එම ග්‍රන්ථයෙහි භාෂාවට පසුබිම් වූ භාෂා සම්ප්‍රදාය ද, එකී ග්‍රන්ථයෙහි අන්තර්ගතයට මූලාශ්‍රය වූ ග්‍රන්ථ සම්ප්‍රදාය ද පිළිබඳ පැහැදිලි අවබෝධයක් විමර්ශකයා සතුව තිබිය යුතු ය. සිංහල භාෂාවෙහි මූල සම්ප්‍රදාය වශයෙන් සැලකෙන පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායත් පෝෂක සම්ප්‍රදාය වශයෙන් සිංහල කෙරෙහි මධ්‍යකාලීන අවධිය තෙක් බලපා ඇති පාලි, ප්‍රාකෘත සහ ද්‍රවිඩ භාෂා සම්ප්‍රදායත් ගැන පටුත්වයක් තිබීම සම්භාව්‍ය සිංහල ග්‍රන්ථ පිළිබඳ නිපුණ අර්ථ වර්ණනා කිරීමට ඉමහත් රුකුළක් වෙයි. මෙම ප්‍රාචීන සම්ප්‍රදාය අනුගමනය කළ වියතුන් විසින් කරන ලද ග්‍රන්ථ විමර්ශන, ග්‍රන්ථ ගෞරවය රැකීමෙහි ලා සාධක විය.

(i) මෙම ඡේදයෙහි සඳහන් වන පරිදි සිංහල භාෂාවෙහි මූල සම්ප්‍රදාය වශයෙන් සැලකෙන්නේ කුමක් ද?

(ii) 'අලංකාර' යන්නෙන් කතුවරයා අදහස් කරන්නේ කුමක් ද?

(iii) ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳ දැනුම අනිවාර්යයෙන්ම තිබිය යුතු වන්නේ කවර වර්ගයේ සාහිත්‍ය කෘති අවබෝධ කර ගැනීම සඳහා ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන මධ්‍යකාලීන අවධිය වන තෙක් සිංහල භාෂාව කෙරෙහි බලපෑ පාලි, ප්‍රාකෘත හා ද්‍රවිඩ භාෂා සම්ප්‍රදායයන් හැඳින්වීම සඳහා කතුවරයා භාවිත කළ විශේෂ යෙදුම කුමක් ද? (ලකුණු 10 යි)

(v) පාඨයක ව්‍යාකරණය ඉක්මවා යන අර්ථය වටහාගත හැක්කේ කුමක් විග්‍රහ කිරීමෙන් ද?

(ආ) පහත දක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සාහිත්‍ය කෘතිවලට කාලීන සමාජ අර්ථයක් මූලභූත වන නිසාත්, සාහිත්‍ය කෘතිවල රචනෝපක්‍රම සමාජ ලක්ෂණයන්ට අනුරූප ව සකස් වන නිසාත්, සාහිත්‍ය නිර්මාණයක අගය හා වැදගත්කම එය සම්පාදිත වූ යුගයට හා සමාජයට සීමා නොවන්නේද'යි කෙනෙකුට මෙහි දී ප්‍රශ්නයක් මතු කළ හැකි ය. එහෙත් කවර උසස් සාහිත්‍ය කෘතියක වුව ද ද්විත්ව ලක්ෂණ විද්‍යමාන වේ. එක් අතකින් එම රචනය ලියැවුණු යුගයට හා සමාජයට විශේෂ වූ ලක්ෂණ එහි දක්නට ලැබේ. අනෙක් අතින් දේශයේත්, කාලයේත් සීමාවලින් විනිර්මුක්ත වූ සාර්වත්‍රික වූත් සර්වකාලීන වූත් ලක්ෂණ එහි දක්නට ලැබේ. ඇත්ත වශයෙන් කවර සාහිත්‍ය නිර්මාණයක වුව ද වැදගත්කම රඳා පවතින්නේ එම විශ්ව සාධාරණ ලක්ෂණ මතයි. ඒ වූ කලී සාහිත්‍ය කෘතියක ධ්වනිතාර්ථයයි. සාහිත්‍ය කෘතියෙන් නැගෙන පොදු ධ්වනියයි. බොහෝ විට එය මනුෂ්‍ය ස්වභාවය හා ජීවිතය සම්බන්ධ සනාතන අර්ථයකින් හෙබි විග්‍රහයක් වන්නේ ය. සාහිත්‍ය කෘතීන්හි මේ විශ්වව්‍යාප්ති ස්වභාවය විද්‍යමාන නොවේ නම් කාලය විසින් මෙන් ම දේශය විසින් ද අපට දූරස්ථ වූ ෂේක්ස්පියර් කිවිඳුන්ගේ දෘශ්‍යකාව්‍ය හෝ රුසියන් නවකතාකරුවන්ගේ නිර්මාණයන් කුමට කියවමු ද? අපට ඒවායින් රසයක් හා අරුතක් උකහා ගැනීමට පිළිවන් වන්නේ කෙසේ ද?

කවර භාෂාවෙන් රචිත වුව ද, කවර දේශයකට අයත් වුව ද, උසස් සාහිත්‍ය නිර්මාණය මිනිසා සතු පොදු වස්තුවක් බවට පත්වන්නේ මේ ධ්වනිතාර්ථය නිසා ය. එහෙත් එම ධ්වනිතාර්ථය උලුප්පා දැක්වීමට කාලීන, දේශීය ලක්ෂණ අත්‍යන්තයෙන් වැදගත්වේ. ඒ ඒ සමාජවල පවත්නා සිරිත් විරිත්, පුද පූජා, ඇදහිලි විශ්වාසාදිය සාහිත්‍ය කෘතියකට ජීවමාන විලාසයක් ආරූඪ කරවීමටත් පාඨකයාගේ විශ්වාසය දිනා ගැනීමටත් බෙහෙවින් අවශ්‍ය වේ.

(ලකුණු 15 යි)

www.pastpaperlk.com

[ හතරවෙනි පිටුව බලන්න.

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) වර්තමාන විද්‍යුත් මාධ්‍ය වෙළෙඳ දැන්වීම් මඟින් සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සාරධර්ම පද්ධතිය කෙරෙහි ඇති කෙරෙන බලපෑම

(ii) ඊකියා වෙළෙඳපොළ හා සමගාමී දියුණු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය

(iii) බලශක්ති ජනනය උදෙසා විකල්ප මාධ්‍ය සෙවීමේ වැදගත්කම

(iv) ළමා චරිත සංවර්ධනයෙහි ලා ජන කතාවලින් සැපයෙන පිටිවහල

(v) රටක සංවර්ධනය කෙරෙහි දැඩි බලපෑම් එල්ල කරන වැඩ වර්ජන

(vi) සංවේදී මානව සමාජයක් ගොඩනැඟීමෙහි ලා සාහිත්‍යයේ කාර්යභාරය

*(ලකුණු 25 යි)*

4. (අ) පහත සඳහන් වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.

(i) ඔවුන් රටෙහි ජ්‍යෙෂ්ඨ පුරවැසියෝ වෙති.

(ii) මුරකරුවන් සත්‍යය කීහයි කවුරුන් විශ්වාස කරත් ද?

(iii) එම විද්‍යාලයේ දක්ෂ සිසුන් ඇත.

(iv) පුරාතනයන් දෙවි දේවතාවුන් පිදූහ.

(v) මහාචාර්යතුමා සිසුන් ඇමතුවේ ය.

*(ලකුණු 05 යි)*

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) දෙමව්පියෝ දරුවන් යහමඟ යවති.

(ii) ඇමතිතුමා දක්ෂ සිසුන් ඇගයීමට ලක් කෙළේ ය.

(iii) මහනාහිමියෝ බෝධි වෘක්ෂයන් රෝපණය කරවති.

(iv) ගුරුවරු සාහිත්‍ය හැදෑරීමෙහි ලා අපූ දිරිමත් කළහ.

(v) ඔවුහු මා පසසති.

*(ලකුණු 05 යි)*

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (මිනිස්සු / මිනිසුන්) පාර සොයද්දී අපි එතනට ගියෙමු

(ii) අම්මා හෝ මම හෝ හෙට ගමට (යමි / යමු)

(iii) පෙරහැරට රැගෙන ආ ඇත් රංචුව දිය නෑමට ගඟට (බසියි / බසිති)

(iv) නිළිය (නළුවන් / නළුවෝ) සමඟ රඟහලට එයි

(v) (කම්කරුවෝ / කම්කරුවන්) හෙට වැඩට ඒවි

*(ලකුණු 05 යි)*

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) කාව්‍යයක **වක්‍රෝක්තිය** ගැබ් විය යුතු ය යන්න, අලංකාරවාදීන්ගේ අදහස විය.

(ii) ඔහු **දේශදේශාන්තරයෙහි** ප්‍රකට විද්වතෙකි.

(iii) අනුරාධපුරය අසලින් **මෙහෙණවරක** නටබුන් හමු ව ඇත.

*(ලකුණු 03 යි)*

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) බොහෝ ඇසූ පිරූ තැන් ඇති

(ii) තම මතයට ම අනුව සිතන

(iii) තම ජන්මභූමියට විරුද්ධව ක්‍රියා කරන්නා

*(ලකුණු 03 යි)*

(ඉ) පහත දී ඇති වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) සද්ධර්ම රත්නාවලිය ධම්මපදට්ඨ කථාවේ ............................... කි.

(ii) සිංහල සංස්කෘතියෙහි ඇති වූ ............................... ඒ ඒ යුග ඇසුරෙන් හඳුනා ගත හැකි ය.

(iii) ගුරුන්ගේ ............................... සිසු දරුවෝ පිළිපදිති.

(iv) සුසිල්වත්හු අනුනට ............................... නො කරති.

(v) සීගිරිය ............................... දනවන ඉපැරණි බලකොටුවකි.

(vi) ශ්‍රී ලංකාවේ පුරාණ අගනගර ............................... සම්පන්න විය.

**(අපවාද / පරිවර්තන / ආශ්චර්ය / අවවාද / ඓශ්වර්ය / අනුවාදය)**

*(ලකුණු 03 යි)*

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) මගේ පියා **කඩ** හිමියෙකි.

(ii) ගුරුතුමී **දම්** පැහැති සාරියක් ඇඳ සිටියා ය.

(iii) **සක්** හඬින් දෙවොල ගිගුම් දෙයි.

(iv) **සල්** ගස් දෙකක් අතර දී බුද්ධ පරිනිර්වාණය සිදුවිය.

(v) පැරණි සිංහල සමාජයේ **කර** යනුවෙන් අයබදු විශේෂයක් පැවැතිණි.

(vi) පසළොස්වක පොහොය දිනවල **මස්** පිණිස සතුන් මැරීම තහනම් ය.

*(ලකුණු 06 යි)*

[ පස්වෙනි පිටුව බලන්න.

www.pastpaperlk.com

6. **තද කළු අකුරින් දී** ඇති පද **කුමන ව්‍යාකරණ අංගයකට අයත් දැයි** දක්වන්න.

   (i) සම්භාව්‍ය සිංහල විචාර **සම්ප්‍රදායක්** ඇති කරදීම **උදෙසා** මාර්ටින් **වික්‍රමසිංහගේ** දායකත්වය අගය කළ යුතු ය.

   (ii) රටේ **අභිවෘද්ධිය සඳහා** මහා පෞරුෂයකින් හෙබි **යෞවන** සමාජ දන් දන් **අත්‍යවශ්‍ය** වේ.

   (iii) **චිරන්තන** වාරි විද්‍යාත්මක නිර්මාණ නූතන ඉංජිනේරුවන් **පවා** මවිත **කරවයි.**

   (iv) **කාව්‍යෝචිත** භාෂා මාධ්‍යයක් **සකසා** ගැනීමට සිංහල **කවීන්** වරින් වර සිදුකරන ලද අත්හදබැලීම් බොහෝවිට හේතු විය.

   (v) සාහිත්‍ය **රසාස්වාදයේදී විචාරකයා** මධ්‍යස්ථයකු වීමට නම් ඔහු **විදග්ධයකු** විය යුතුම ය. *(ලකුණු 15 යි)*

7. (අ) පහත දක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

   (i) නිෂ්ඵල වැඩක් කිරීම

   (ii) මහදීම බලාපොරොත්තු සුන්වීම

   (iii) අන්තිම උත්සාහයත් දැරීම

   (iv) තණ්හාව නිසා කරදරයට වැටීම

   (v) එක සමාන අය වීම

   (vi) යමක් කිරීමට පෙර සැලසුම් කිරීම *(ලකුණු 03 යි)*

(ආ) පහත දී ඇති **රුසිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

| | |
|---|---|
| (i) අං ඒම | (ii) එකා යකා වීම |
| (iii) කුඩම්මාගේ ආදරය | (iv) ගලේ කෙටූ අකුරු |
| (v) පිස්සීගේ පළා මල්ල | (vi) මෝල්ගහෙන් පට්ට ගැනීම |

*(ලකුණු 03 යි)*

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

| | |
|---|---|
| (i) ඇළ දොළ | (ii) ගිහි පැවිදි |
| (iii) නහින දෙහින | (iv) පොලු මුගුරු |
| (v) උරුම කරුම | (vi) අඩ දබර |

*(ලකුණු 03 යි)*

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

| | |
|---|---|
| (i) පුන්නනවා | (ii) හින්නා |
| (iii) ඔලගං | (iv) කඩුච්චා |
| (v) කුංචා | (vi) අම්මණ්ඩි |

*(ලකුණු 03 යි)*

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

| | |
|---|---|
| (i) දලුමුර | (ii) සද්දකාරයා |
| (iii) මුත්තෙට්ටුව | (iv) අම්බරුවා |
| (v) ගඟුල කරුණා කරනවා | (vi) හළඹ |

*(ලකුණු 05 යි)*

8. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හින්දුශිල්පශාස්ත්‍රග්‍රන්ථවලනෘත්‍යමූර්තිනවයක්විස්තරකරතිබේනටරාජායනුශිවගේනෘත්‍යාවස්ථාවන්පිළිබිඹුකිරීමයිඑහෙත්ඵහිද ප්‍රභේදකිහිපයක්සාමාන්‍යයෙන්නටරාජප්‍රතිමාවෙහිඅත්සතරකිසිරුරඅළුවලින්තැවරුණේවියදකුණේපිටුපසඅතෙහිඋඩැක්කියක් අතින්අතෙහිඅභයමුද්‍රාවදක්වේවම්පැත්තෙන්එසවූඅතකඅහුරුකබලකිඅනෙකපපුවදෙසටනමාඅතේඇඟිලිපහතටඑල්ලෙනඅයුරින් දක්වෙයිදකුණුකකුලපිහිටියේඅපස්මාරයනම්යක්ෂයෙකුගේසිරුරමතයඑයදණහිසින්නැම්ණි

   (i) ඉහත ඡේදය ශාස්ත්‍රීය යැ'යි බොහෝ සෙයින් ම පිළිගත් ක්‍රමය අනුව පද බෙද අවශ්‍ය විරාම ලක්ෂණ යොද නැවත ලියන්න.

   (ii) **'පාපිලි'** සහිත පද **දෙකක්** ඡේදයෙන් උපුටා දක්වන්න.

   (iii) **'පිළිබිඹු'** යන පදයෙහි ඇතුළත් **'පිල්ලම්'** නම් කරන්න.

   (iv) ඡේදයේ සඳහන් **'ගැට ඇලපිල්ල'**, **'රකාරාංශය'** අන්තර්ගත වචන **දෙකක්** ලියා දක්වන්න.

   (v) ඡේදයේ සඳහන් **'විභක්ති'** පද **දෙකක්** උපුටා දක්වන්න. *(ලකුණු 15 යි)*

* * *

www.pastpaperlk.com